# ජාතික රාජ්‍ය සභාවේ
# 1974 අංක 14 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 මැයි මස 3 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 14 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 18 වන දින]

එල්.ඩී.—ඕ. 17/73

ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 14 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (1) මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උප වගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 117 වන අධිකාරයේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

'(1) ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම සාධන පත්‍රයක් ඒ සාධන පත්‍රය බලපාන ඉඩම පිහිටි කොට්ඨාසය සඳහා වෙන් කර තිබෙන පොතේ ඒ ඉඩමට බලපාන පළමු වන ලියාපදිංචි කළ සාධන පත්‍රය ලියාපදිංචි කොට තිබෙන පත්ඉරුවෙහි හෝ එය ඉදිරියට ගෙන යෑම සඳහා ආරම්භ කරනු ලැබූ (ඒ කාණ්ඩයේ ම හෝ වෙනත් කාණ්ඩයක වුව ද) වෙන් වූ අංකයක් දරන වෙනත් පත්ඉරුවක එකී පත්ඉරු සම්බන්ධ වන සේ හරස් යොමු නියමිත ආකාරයෙන් යොදා ලියාපදිංචි කළ යුතු ය :

එසේ වුව ද—

(අ) සුදුසු යැයි රෙජිස්ට්‍රාර් විසින් අදහස් කරනු ලැබේ නම්, සාධන පත්‍රයක් ලියාපදිංචි කිරීම ඒ ඉඩමට ම හෝ එහි යම් කොටසකට බලපාන යම් පූර්ව ලියාපදිංචි කිරීමකට සම්බන්ධ වන සේ හරස් යොමු නියමිත ආකාරයෙන් යොදා අලුත් පත්ඉරුවක සටහන් කළ හැකි ය ;

(ආ) ඒ ඉඩමට ම බලපාන කිසි ම සාධන පත්‍රයක් කලින් ලියාපදිංචි කොට නොමැති අවස්ථාවක, සාධන පත්‍රය රෙජිස්ට්‍රාර් විසින් වෙන් කරනු ලබන අලුත් පත්ඉරුවක ලියාපදිංචි කළ යුතු ය ; තව ද

(ඇ) වෙනත් රෙජිස්ට්‍රාර්වරයකුගේ (මෙහි මින් මතු "පරණ කොට්ඨාසය" යනුවෙන් සඳහන් කරනු ලබන) සම්පූර්ණ කොට්ඨාසයකින් හෝ එහි කොටස කින් අලුත් රෙජිස්ට්‍රාර් කොට්ඨාසයක් ඇති කරනු ලැබූ අවස්ථාවක, අලුත් කොට්ඨාසය ඇති කිරීමේ

2—ඒ 05489—11,937 (74/4)

දිනයේ දී සහ ඉන් පසු අලුත් කොට්ඨාසය සංයුක්ත වන පරණ කොට්ඨාසය තුළ ඒ දිනයට පෙර සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් පිහිටි, හෝ අවිස්ථාවෝචිත පරිදි, ඒ දිනයේ දී හෝ ඉන් පසු අලුත් කොට්ඨාසයේ කොටසක් සංයුක්ත වන පරණ කොට්ඨාසයේ කොටසක ඒ දිනයට පෙර සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් පිහිටි ඉඩම් සම්බන්ධයෙන්—

(i) 12 වන වගන්තිය යටතේ පරණ කොට්ඨාසයට වෙන් කර තුබූ (මෙහි මින් මතු "පරණ පොත" යනුවෙන් සඳහන් කරනු ලබන) පොතේ ඒ ඉඩම් අතුරින් කිසිවකට බලපාන සාධන පත්‍ර පිළිබඳ ලියාපදිංචි කිරීම් ඇතුළත් පත්ඉරු ඒ වගන්තිය යටතේ අලුත් කොට්ඨාසයට වෙන් කර තුබූ (මෙහි මින් මතු "අලුත් පොත" යනුවෙන් සඳහන් කරනු ලබන) පොතෙහි කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද

(ii) අලුත් පොතෙහි සටහන් කරනු ලැබූ එකී යම් ඉඩමකට බලපාන සාධන පත්‍රයක් පිළිබඳ ලියාපදිංචි කිරීමක් සහ පරණ පොතෙහි සටහන් කරනු ලැබූ ඒ ඉඩමට බලපාන සාධන පත්‍ර ලියාපදිංචි කිරීම් නියමිත ආකාරයෙන් අලුත් පොතෙහි සහ පරණ පොතෙහි යොදනු ලබන හරස් යොමු මගින් සම්බන්ධ කළ යුතු ය.'.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියෙහි කරන ලද සංශෝධනය ප්‍රධාන ප්‍රඥප්තිය ආරම්භ වීමේ දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන මේ පනත ආරම්භ වීමේ දිනට පෙර දෙන ලද යම් අධිකරණයක තීරණයක් කෙරෙහි බලනොපාන්නේය.